# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2274/11 – 2022 අප්‍රේල් 05 වැනි අඟහරුවාදා – 2022.04.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය.: වඩ/එන්/එල්ඒ/ඒසීකියු/ඒච් ආර්/1
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය.: 4-3/18/2018/FH/413.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ පරවශතාවේ විස්තර:*

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ වඩමරාච්චි උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පේද්‍රුරුතුඩුව ගමේ, ජේ/401, පේද්‍රුරුතුඩුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයට අයත් සර්වේයර් ජනරාල්ගේ මූ.පි.අ. යා-2909 දරන සැලැස්මේ පෙන්නුම් කර ඇති පහත විස්තර සඳහන් ඉඩම් කැබලි:

1. කැබලි අංක 1
ඉඩමේ නම: මරුතුනින්රතෙනි; විස්තරය: අවුරුදු 15-20 අතර පොල්ගස් දාහතරක් සහ පිළිමයක් අඩංගු වේ; හිමිකම් කියන අය: රජයේ ඉඩම; ප්‍රමාණය: හෙක්. 0.4608.

2. කැබලි අංක 2
ඉඩමේ නම: මරුතුනින්රතෙනි; විස්තරය: ස්ථිර ගොඩනැගිල්ලක් සහ අවුරුදු 7-10 ක පොල් ගස් හයක් අඩංගු වේ; හිමිකම් කියන අය: රජයේ ඉඩම; ප්‍රමාණය: හෙක්. 0.0152.

3. කැබලි අංක 3
ඉඩමේ නම: තිල්ලයිනින්රතෙනි; විස්තරය: ළිඳක කොටසක් සහ අවුරුදු 15-20 ක පොල් ගස් තුනක් අඩංගු වේ; හිමිකම් කියන අය: සෙල්වරත්නම් ජෝතිරාජ් සහ බිරිඳ මේරි සුතර්සිනී; ප්‍රමාණය: හෙක්. 0.0025.

4. කැබලි අංක 4
ඉඩමේ නම: තිල්ලයිනින්රතෙනි; විස්තරය: ළිඳක කොටසක්, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් (අතහැර දමා ඇත) සහ අවුරුදු 15-20 ක පොල් ගස් දෙකක් අඩංගු වේ; හිමිකම් කියන අය: රෙජිනෝල්ඩ් ඉරුතයානාදන් සහ බිරිඳ ඉන්දුජා; ප්‍රමාණය: හෙක්. 0.0054.

1A – G 36546 – 27 (2022/04)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

5. කැබලි අංක 5
ඉඩමේ නම: තිල්ලයිනින්රතෙනි; විස්තරය: අවුරුදු 15-20 ක පොල් ගසක් අඩංගු වේ; හිමිකම් කියන අය: කනකර් සුප්‍රමනියම් සහ බිරිඳ සන්දිකාපරමේශ්වරි; ප්‍රමාණය: හෙක්. 0.0084.

6. කැබලි අංක 6
ඉඩමේ නම: නොදනී; විස්තරය: අවුරුදු 15-20 ක පොල් ගස් දෙකක් අඩංගු වේ; හිමිකම් කියන අය: නොදනී; ප්‍රමාණය: හෙක්. 0.0070.

7. කැබලි අංක 7
ඉඩමේ නම: තිල්ලයිනින්රතෙනි; විස්තරය: අවුරුදු 15-20 ක පොල් ගස් හතරක් අඩංගු වේ; හිමිකම් කියන අය: සෙල්වරත්නම් ඇලෙක්සැන්ඩර් බිරිඳ කයල්විලි සහ සෙල්වරත්නම් ජෝතිරාජ් බිරිඳ මේරි සුතර්සිනී; ප්‍රමාණය: හෙක්. 0.0086.

8. කැබලි අංක 8
ඉඩමේ නම: තිල්ලයිනින්රතෙනි; විස්තරය: තාවකාලික වගාව අඩංගු වේ; හිමිකම් කියන අය: කලයිවේන්දන් රෙක්සියා; ප්‍රමාණය: හෙක්. 0.0025.

9. කැබලි අංක 9
ඉඩමේ නම: තිල්ලයිනින්රතෙනි; විස්තරය: තාවකාලික වගාව අඩංගු වේ; හිමිකම් කියන අය: තුරෙයිසාමි රත්නවේලායුතම්; ප්‍රමාණය: හෙක්. 0.001.

10. කැබලි අංක 10
ඉඩමේ නම: තිල්ලයිනින්රතෙනි; විස්තරය: තාවකාලික වගාව අඩංගු වේ; හිමිකම් කියන අය: නාගලිංගම් තිරුචෙල්වම් සහ බිරිඳ සරෝජා; ප්‍රමාණය: හෙක්. 0.0007.

11. කැබලි අංක 11
ඉඩමේ නම: තිල්ලයිනින්රතෙනි; විස්තරය: වළක කොටසක් අඩංගු වේ; හිමිකම් කියන අය: සුමති සුන්දරලිංගම්ගේ බිරිඳයි; ප්‍රමාණය: හෙක්. 0.0007.

12. කැබලි අංක 12
ඉඩමේ නම: මරුතුනින්රතෙනි සහ තිල්ලයිනින්රතෙනි; විස්තරය: තාවකාලික වගාව අඩංගු වේ; හිමිකම් කියන අය: එරම්පමූර්තිගේ දුව නාගේශ්වරී; ප්‍රමාණය: හෙක්. 0.0009.

13. කැබලි අංක 13
ඉඩමේ නම: තිල්ලයිනින්රතෙනි; විස්තරය: ළිඳක් අඩංගු වේ; හිමිකම් කියන අය: මාර්කන්ඩන් තිරුනීලකන්ඩන්; ප්‍රමාණය: හෙක්. 0.0416.

14. කැබලි අංක 14
ඉඩමේ නම: මරුතුනින්රතෙනි; විස්තරය: තාවකාලික වගාව අඩංගු වේ; හිමිකම් කියන අය: සසිකරන්ගේ බිරිඳ ජනනි; ප්‍රමාණය: හෙක්. 0.0233.

15. කැබලි අංක 15
ඉඩමේ නම: මරුතුනින්රතෙනි; විස්තරය: තාවකාලික වගාව අඩංගු වේ; හිමිකම් කියන අය: කනේසමූර්ති පුලේන්තිරන්; ප්‍රමාණය: හෙක්. 0.0036.

16. කැබලි අංක 16
ඉඩමේ නම: තිල්ලයිනින්රතෙනි; විස්තරය: ළිඳක කොටසක්, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් (අත්හැර දමා ඇත); හිමිකම් කියන අය: රජයේ ඉඩම; ප්‍රමාණය: හෙක්. 0.0018.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 මැයි මස 30 වැනි දින පෙ. ව. 10.00 ට වඩමරාච්චි උතුර - පේදුරුතුඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2022 මැයි මස 16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වාභාවයත් එකී ඉඩම්/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතු ය.

ආල්වාප්පිල්ලයි සිරි,
ප්‍රාදේශීය ලේකම්.

2022 මාර්තු මස 07 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
වඩමරාච්චි උතුර
පේදුරුතුඩුව.

EOG 04- 0022